# දේශීය නිල වෛද්‍යක්‍රමය හා සුසම්බන්ධිත සංකීර්ණ ඥාන පද්ධතිය

**H.M. සේනාධීර[1], K.I.W.K. සෝමරත්න[2]**

දේශීය වෛද්‍යක්‍රමය හෙවත් සිංහල වෙදකම මහා රාවණා රජු කාලයේ සිට පැවත එන බව ජනවහරේ දැක්වේ. මෙරටට අනන්‍ය වූ මෙම වෛද්‍යක්‍රමයේ ශාඛාවන් අතරින් දේශීය නිල වෙදකම සුවිශේෂී ස්ථානයක් උසුලයි. එසේ වුවද මෙම දේශීය නිල වෛද්‍යක්‍රමය නව්‍ය හා ආයුර්වේද වෛද්‍යක්‍රමයන්ට සාපේක්ෂව විධිමත්ව හා ක්‍රමානුකූලව සමාජගතවීමේ කිසියම් වූ දුර්වල බවක් දක්නට ඇතැයි හැඟේ. එයට බොහෝ හේතූන් දැක්විය හැකි වුවත්, මූලික හේතුව ලෙස සැළකිය හැක්කේ බාහිර දැක්මෙන් සරලව පෙනෙන්නා වුවද, මෙම නිල වෛද්‍යක්‍රමයේ ක්‍රියාවට නංවනු ලබන සංකීර්ණ ශාස්ත්‍රීය පද්ධතිය පිළිබද නොසැළකිළිමත් වීම හෝ එම සමස්ථය පිළිබද නොදැනීම නිසා අවිධිමත් අන්දමින් භාවිතයට ගැනීමට ගොස් එම නිල වෙදකම යල් පැන ගිය තත්වයකට පත්වීම විය හැක. මෙම රචනාවේ අරමුණු වන්නේ ඉහත සඳහන් කළ නිල වෛද්‍යක්‍රමයේ ශාස්ත්‍රීය හා දර්ශනික පැතිකඩ මර්මවිධි, සල්ලවිධි, සිරාව්‍යධ හා ශරවිධි චිකිත්සා ආශ්‍රයෙන් ඉස්මතු කොට පෙන්වා දිම හා දැනට අභාවයට යන්නා වූ එම අංශයේ උපයෝගීතාවය කාලීන අවශ්‍යතාවයක් ලෙස විද්වතුන්ගේ අවධානයට යොමු කරලීමය. මේ සඳහා කරුණු රැස් කිරීමට පහත සඳහන් මූලාශ්‍ර පරිශීලනය කරන ලදී.

1. සාහිත්‍යමය වශයෙන් ලාඞ්කීය වෛද්‍යග්‍රන්ථ මෙන්ම භාරතීය ආයුර්වේද කෘතීන්ද
2. මහනුවර රාජධානි සමයේ ප්‍රසිද්ධ දේශීය වෛද්‍ය ශාස්ත්‍රාලයක්වූ මධ්‍යම පළාතේ

අත්තරගම රජමහා විහාරයෙහි ක්ෂේත්‍ර චාරිකාවක යෙදීමෙන්ද

---

[1] අංක 526, හින්නාරන්දෙණිය, ගම්පොල

[2] නිදන චිකිත්සා දෙපාර්තමේන්තුව, දේශීය වෛද්‍යවිද්‍යා ආයතනය
කොළඹ විශ්ව විද්‍යාලය,
Email: ayubowann@gmail.com

3. පාරම්පරික වෛද්‍යවරුන් කිහිපදෙනෙකු සමඟ යෙදුනු සාකච්ඡා කිරීමෙන්ද හා

4. ජනවහර ආශ්‍රයෙන්ද රැස්කරගත් තොරතුරු මෙහිදී විශ්ලේෂණයට භාජනය කරන ලදී.

මෙසේ ලබාගත් තොරතුරු වලින් හෙලිවනුයේ සාම්ප්‍රදායික නිල වෛද්‍යවරයෙකු මර්ම විෂය ඇතුළත්වූ ශරීර රචනාව හා ශරීර ක්‍රියාවිඥානය පිළිබඳ පෘථුල අවබෝධයක් සමඟම අෂ්ටවිධ (විදීම, ලේ හැරීම, ආදි වූ) සැත්කම්ද, අමතරව පිලිස්සීම, කාරම් තිබීම්, පූඩා කැවීම්, වක්කම් ඇල්ලීම්, වණ කිරීම් ආදි වූ පරාශල්‍ය ක්‍රම පිළිබඳවද මනා අවබෝධයක් හා ශිල්පීය නිපුණතාවයක්ද ලබා තිබිය යුතු බවය. තවදුරටත් එවැනි නිල වෛද්‍යවරයෙකු රන්, රිදී, ආදි ලෝහ පිළිබඳ දැනුමක් හා ජ්‍යොතිෂ ශාස්ත්‍රානුකූලව දිනයේ හා සිරුරේ මරු, ශූල, විෂ, අමෘත කලා පිහිටීම නිර්ණය කොට ප්‍රතිකාරයේ යෙදීමට සුදුස්සෙකු විය යුතුය.

ඉහත තොරතුරු සියුම්ව විග්‍රහ කොට බැලීමේදී පැහැදිලි වන්නේ දේශීය නිල වෙදකම, වෛද්‍යමය හා වෛද්‍යමය නොවන ශාස්ත්‍රයන් කිහිපයක මනා වූ සුසංයෝගයකින් (an interdisciplinary science) බිහි වූ ප්‍රතිඵලයක් බවය. එසේම එම නිල වෙදකම ශාකමය, සත්ත්වමය හා ඛණිජමය ඖෂධ අමුද්‍රව්‍ය හිඟ වර්තමාන සමාජයට පහසුවෙන් හා අවම ඖෂධ ප්‍රමාණයක උපයෝගීතාවයකින් මහජනයාගේ සුභසිද්ධිය පිණිස දේශීය සෞඛ්‍ය සේවාවේ එක් අංගයක් ලෙස වැඩිදියුණු කිරීමේ ඉහළ ශක්‍යතාවයක් පවතින බවත්ය.

ප්‍රමුඛ පදඃ දේශීය නිල වෛද්‍යක්‍රමය, ඥාන පද්ධතිය, මර්ම, නිල ස්ථාන

**Title:** Complex System of Knowledge related to the Traditional Nila Vedakama (Treting Patients through Vital Points of the Human Body)

**Keywords:** Indigenous Nila Medicine, Interdisciplinary science, Vital points, Nila